# සීමා නීර්ණය ගැසට් කිරීම මාසයකින් කල් දැමේ

## ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දෙයි

නිශාන්ති රාමනායක - කොළඹ අධිකරණ

සීමා නිර්ණ කමිටුව විසින් පළාත් පාලන අමාත්‍යවරයා වෙත භාරදුන් සීමා නිර්ණ වාර්තාව නිසි අධ්‍යයනයකින් පසුව මාසයක් ඇතුළත ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට විෂය භාර අමාත්‍යවරයා විසින් පියවර ගනු ඇතැයි ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා ඊයේ (30)

පිටුව 2

### සීමා නීර්ණය......

ලක්බිම

ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දුන්නේය.

පළාත් පාලන අමාත්‍යවරයා ඒ බව දැනුම් දෙන ලෙසට තමාට උපදෙස් ලබාදුන්නේ යැයිද ජනාධිපති නීතිඥවරයා එහිදී වැඩිදුර-ටත් දැනුම් දුන්නේය. පළාත් පාලන මැතිවරණය කඩිනමින් පැවැත්වීමට පළාත් පාලන අමාත්‍යවරයා ප්‍රමුඛ වගකිවයුත්තන්ට නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා පැපරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා විසින් ගොනුකර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම සලකා බැලීම සඳහා ඊයේ (30) කැඳවූ අවස්ථාවේදී ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා ඒ බව දැනුම් දුන්නේය. එම මූලික අයිතිවාසිකම් පෙත්සම ප්‍රියසාද් ඩෙප්, උපාලි අබේරත්න හා නලින් පෙරේරා යන ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල හමුවේදී කැඳවිණි.

විසිරුවා හරින ලද පළාත් පාලන ආයතනවල ඡන්දය කඩිනමින් පවත්වා ඒවාට නියෝජිතයින් පත් කිරීමට නියෝගයක් නිකුත් කරනා ලෙසත් විවිධ හේතු දක්වමින් දිනෙන් දින පළාත් පාලන ඡන්දය කල් දැමීම නිසා ජනතාව සතු ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය උල්ලංඝනය වන බවත් පෙන්වා දෙමින් ගොනුකර තිබූ එම මූලික අයිතිවාසිකම් පෙත්සම ලබන මාර්තු 13 වැනිදා යළි කැඳවීමටද විනිසුරු මඬුල්ල නියම කළේය.